**2017 - සමෘද්ධි ක්ෂුද්‍ර මූල්‍ය ලිපිද්‍රව්‍ය චක්‍රීය අරමුදල**

-----------------------------------------------------

සමෘද්ධි ක්ෂුද්‍ර මූල්‍ය ලිපිද්‍රව්‍ය චක්‍රීය අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 අංක 1 දරන දිවි නැගුම පනතේ 45 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට සමෘද්ධි ක්ෂුද්‍ර මූල්‍ය ලිපිද්‍රව්‍ය චක්‍රීය අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රමිත අංක 07 ප්‍රකාරව උපකරණවලට සමාන අගයකින් ක්ෂය වෙන් කර තිබෙන විට එම දේපලවල ධාරණ අගය නිශ්චය කර ගිණුම්ගත කිරීමට හෝ පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතු වුවද, සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ ගත් මිල රු. 119,963 ක් වූ කාර්යාලිය උපකරණ සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රමිත අංක 9 හි 47 ඡේදය ප්‍රකාරව තොග මැනීමේදී යොදාගත් ගිණුම්කරන ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 වර්ෂයේදී මිලදී ගෙන තිබූ රු. 193,372 ක  මුද්‍රිත ලිපිද්‍රව්‍ය වෙනුවෙන් අවශ්‍ය වෙන් කිරීම් කර නොතිබුණි.

(ආ) ලිපි ද්‍රව්‍ය නිකුත් කිරීම් නිසි පරිදි තොග ලේඛනයට ඇතුළත් කර නොතිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන දිනට ලිපි ද්‍රව්‍ය තොග ලෙජරයේ වටිනාකම රු. 40,200,203 ක් ද ගබඩා තොග ලේඛනය අනුව ශේෂය රු. 46,803,933 ක් විය. මෙම තොග ශේෂයන් දෙකෙහි වෙනස රු. 6,603,730 ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ලිපි ද්‍රව්‍ය අලෙවි ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

#### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

2017 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් කාර්යාල 7 කට අදාළ තොග ශේෂය රු. 3,719,440 ක් සම්බන්ධයෙන් තොග සමීක්ෂණ වාර්තා සහ රු. 1,452,189 කට අදාළ ණය ඉන්වොයිස්පත් විගණනයට  ඉදිරිපත් නොකෙරුණි.

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි රෙගුලාසි 633 (1) | මුද්‍රණ කටයුතු භාරගෙන රජයේ මුද්‍රණාලාධිපතිට ඉටුකළ නොහැකි අවශ්‍යතාවක රජයේ මුද්‍රණාලාධිපති විසින් මිල සැදැහුම් කැඳවා එම කාර්ය පෞද්ගලික ආයතනයට භාරදිය යුතුය. එසේ වුවද, රෙගුලාසිවලින් බැහැරව සමාලෝචිත වර්ෂයේ මුද්‍රණ කටයුතු පෞද්ගලික ආයතන මඟින් සිදුකරවාගෙන රු. 56,020,270 ක් ගෙවා තිබුණි. |
| (ආ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 මාර්ගෝපදේශය | අවම වශයෙන් වසර 3 ක කාලයක් සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තු ගත කළ යුතු අතර අදාළ වර්ෂය සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කොට මාස 6 කට වරක් යාවත්කාලීන කළ යුතු වුවත් ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. |
| (ඇ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 චක්‍රලේඛය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදය | ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් තවදුරටත් පවත්වාගෙනයාමට සාධාරණ හේතු ඇත්නම් එවැනි අරමුදල් පාර්ලිමේන්තු පනතක් මගින් නීතිගත කිරීමට කටයුතු කලයුතු බව දැක්වෙතත් අරමුදල ව්‍යවස්ථාපිත කිරීමට කටයුතු නොකර බැංකු කළමනාකරණ මණ්ඩලය යටතේ අරමුදල පවත්වා ගෙන යමින් තිබුණි. |

## 2.4 ලැබිය යුතු ගිණුම්

ලංකා සළුසල ආයතනයට අයත් ගබඩාවේ ගබඩා කර තිබූ ලිපිද්‍රව්‍ය තොග 2010 වර්ෂයේදී ඉවත් කර ගෙන තිබූ නමුත්, ඒ සඳහා ගෙවූ රු. 1,454,112 ක් වූ ගබඩා කුලී තැන්පතුව ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු. 16,507,651 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 23,314,160 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 6,806,509 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. මෙම පිරිහීමට අරමුදලේ ලිපි ද්‍රව්‍ය අලෙවි ආදායම රු. 10,943,583 කින් පහල යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

**4.1** **කළමනාකරණ ක්‍රියාකාරකම්**

ගබඩාවකට සුදුසු ප්‍රමිතයකින් තොරව ලිපි ද්‍රව්‍ය ගබඩා ගොඩනැගිල්ල ඉදිකර තිබීම සහ අවිධිමත් ලෙස තොග ගබඩා කර තිබූ අතර 2017 මැයි 18 දින සුළඟින් හා ජල ගැලීම් හේතු කොටගෙන ගබඩාව තුලට ජලය එකතුවීමෙන් රු. 5,411,721 ක් වටිනා තොග වර්ග 45 ක තොග අයිතම 602,750 ක් විනාශ වි තිබුණි. එම විනාශ වූ ලිපිද්‍රව්‍ය තොග සම්බන්ධයෙන් 2021 දෙසැම්බර් මස විගණිත දිනය වනවිටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**5.** **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**5.1** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් තුළ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2021 නොවැම්බර් 19 දින ඉදිරිපත් කර තිබුණි.

**5.2** **අයවැය ලේඛනමය පාලනය**

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1 ඡේදය හා 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදය ප්‍රකාරව අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් අයවැය ලේඛනයක් සකස් කර නොතිබුණි.

**6.** **පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලද අතර අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කර ගිණුම් පොත්පත් හා වාර්තා ක්‍රමානුකූලව පවත්වා ගැනීම කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.